පුරුෂෝත්තම මනෝ ව්‍යසනයට හසුනොවන සමරිසි මානුෂිකත්වය

මෙම ලිපිය 2016.07.17 ඉරිදා දිවයින පුවත්පතේ ලිපියක් ලෙස මිත්‍ර ශ්‍රී කරුණානායක විසින් ඉදිරිපත් කළ "ගැහැනු වෙන්න හදන පිරිමි" ලිපියට පිළිතුරක් වේ. ලිපියට පිළිතුරක් සැපයීමට ප්‍රථම LGBTIQ ප්‍රජාව යනු කවුරුන්ද යන්න හඳුනාගත යුතුව තිබේ. පොදුවේ සමසෙනෙහස් කාන්තා (Lesbian) සමසෙනෙහස් පුරුෂ (Gay) ද්වි සෙනෙහස් කාන්තා හා පුරුෂ (Bisexual) සංක්‍රාන්ති සමාජභාවීය (Transgender) අන්තර්ලිංගික (Intersex) හා ලිංගික දිශානතිය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනන්‍යතාවය ප්‍රශ්නභාවී (Questioning) යන්න වෙනස් ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අනන්‍යතාවක් ලෙස තේරුම් ගැනීම අත්‍යවශ්‍ය වේ. එයට හේතුව මිත්‍ර විසින් ඔහුගේ ලිපිය ලිංගිකත්වය හා ලිංගික ක්‍රියාකාරකම්වල ඇති වාණිජමය මූලධර්ම මත පදනම්ව ලියා ඇති බැවිනි. එමෙන්ම එවැනි ලිවීමකදී මාධ්‍යවේදියෙකු සතුවිය යුතු මානවවාදී ගුණය මෙන්ම මාධ්‍ය ආචාර්ධර්මවලට ඇති සංවේදීභාවය අමතක කර දමා ඇති බැවිණි.

නපුංසක යන පදය ඔහු විසින් බොහෝ අවස්ථාවලදී සඳහන් කර ඇති නිසා මිත්‍ර විසින් නපුංසක යන පදය සොයාගත්තේ කොහෙන්ද? ඔහු නපුංසක යන්න අර්ථ දක්වන්නේ කෙසේද යන්න ගැටලුවක් පවතී. එහෙත් ඔහුගේ ලිපියේදී ගැහැනුන්ට අඳින පිරිමි හා පිරිමින්ට අඳින ගැහැනු යනුවෙන් දක්වා තිබේ. මා විසින් දන්නා පරිදි පිරිමියා විසින් ගැහැනියට ඇඳීම හුදෙක් කාමලෝලී හෝ අශ්ලීල ලෙස දැකිය යුත්තක් නොව බොහෝ රටවල සංස්කෘතික හා කලාත්මක හා කලාත්මක ප්‍රකාශන ලෙස විරුද්ධ ලිංගිකයන් ලෙස නිරූපණය වීම සිදුවී තිබේ. අදවද සිදුවේ, පහත රට ශාන්ති කර්ම, සොකරි, බලි තොවිල් මෙන්ම නවගමුව පත්තිනි දේවාලයේ ප්‍රධාන කපු මහතාද ගැහැනියට අඳී. එහිදී ඔවුන්ගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය අප ප්‍රශ්න කරන්නේ නැත. හේතුව කලාත්මක නිර්මාණයක් ලෙස ලිංගිකත්වය ප්‍රතිනිර්මාණය කිරීමේදී වැදගත්වන්නේ කලාත්මක ප්‍රකාශනය මිස ගැහැනු පිරිමි බව නොවන නිසාය. කලාත්මක හෝ පරමාදර්ශී පදනමක් නොමැතිව පිරිමියා විසින් ගැහැනියට ඇඳීම හෝ ගැහැනිය විසින් පිරිමියාට ඇඳීම මිත්‍රට අනුව "නපුංසකවීම" වේ. පිරිමියා විසින් ගැහැනියට ඇඳීම හෝ ගැහැනිය විසින් පිරිමියාට ඇඳීම (Crossdressing) හුදෙක් මානසික ප්‍රකාශනයක් ලෙස ගත යුතු බව අන්තර්ජාතික මනෝවිද්‍යා සංගමයේ විශ්වාසයයි. පුද්ගලයන් විසින් තම මනෝභාවයන්, මානසික ප්‍රකාශන මතුපිට සමාජයට ප්‍රකාශ කිරීම නපුංසකභාවයක් නොව ඔහු හෝ ඇය විසින් පෙනී සිටීමට කැමති ලිංගරූපීභාවය ප්‍රකාශ කිරීමක් වේ. විශාදය, ක්ලමතය හෝ නියුරෝසියාවෙන් පෙළෙන්නෙකු ඔහු හෝ ඇයගේ මානසික ප්‍රකාශන ලෙස යම් ප්‍රකෝපකාරී හැසිරීමක් ප්‍රකට කිරීම සාමාන්‍ය තත්ත්වයක් ලෙස පිළිගන්නා ලෙස එවැනි මානසික ආබාධයකින් පෙළෙන්නන් සමග ඇසුරුකරන්නන්ට වෛද්‍යවරුන් ලෙස අවවාද කිරීම කරනු ලැබේ. එලෙසම පුද්ගලයන්ගේ හැසිරීම සමාජයට හෝ කිසි අයෙකුට හානියක් නොවේ නම් ඒවාට අපහාසකිරීම් හෝ විවේචනය කිරීමට ප්‍රථමව එවැනි හැසිරීම්වලට හේතු මොනවාද යන්න තේරුම්ගත යුතුවේ. මාධ්‍යවේදියා සමාජ සම්ප්‍රේෂකයෙකු විය යුත්තේ කරුණු සොයාබලා සමාජයට පණිවිඩයක් ලබාදීමට මිස සමාජයට කුණුරසය ලබාදීමට නොවන බව අපගේ විශ්වාසයයි.

මිත්‍ර යුරෝපා රටකදී කළ සංචාරයේදී අයදුම්පත්‍ර පිරවීමේදී අනෙකුත් (Others) ලිංගිකයන් පිළිබඳ දැන ගැනීමට ලැබී ඇත. එහෙත් ඔහු තම ලිපියේදී ඒ කවුරුන්ද යන්න සොයාබලා නිවැරැදි ලෙස වාර්තා කළේ නම් මෙම ලිපිය මගින් පාඨකයා ස්ත්‍රී හා පුරුෂ පමණක් නොව වෙනත් ලිංගිකයන්ද සිටින බවත් ඔවුන් හඳුන්වන්නේ අන්තර්ලිංගික (Intersex) යනුවෙන් බවත් තේරුම් ගැනීමට ඉඩ තිබිණි. එමෙන්ම මිත්‍ර විසින් "වෛද්‍ය විද්‍යාවට අනුව ළදරුවෙකු මවුකුසයෙන් බිහිවන්නේ පිරිමි හෝ ගැහැනු යනුවෙන් නියත එක් කුලයකට අයත්වයි" යනුවෙන් දක්වන්නේ කුමන වෛද්‍ය විද්‍යාව පිළිබඳ යන්න පැහැදිලි කර නොමැත. මවුකුසයේදී දරුවෙකු පිරිමි හෝ ගැහැනුභාවය ලබන්නේ මිත්‍ර විසින් උලුප්පා දැක්වීමට උත්සාහ කරන ආකාරයේ සංස්කෘතිකමය හෝ සදාචාරමය ආකාරයකට නොවේ. ජීව විද්‍යාත්මකව ගැහැනියක ගැබ්ගැනීමත් සමග නිර්මාණය වන කළලය ලිංගික වශයෙන් විභේදනය වන්නේ ක්‍රෝමසෝම නම් ජානමය සම්භවයක් සහිත හෝර්මෝන මගිනි. ජීව විද්‍යාව එකී ක්‍රෝමසෝම අණු ඞ හා ශ යන සංකේත මගින් පැහැදිලි කරන අතර ඞඞ ආකාරයේ ක්‍රෝමසෝම මගින් ගැහැනු කළලයක්ද ඞශ ආකාරයේ ක්‍රෝමසෝම මගින් පිරිමි කළලයක්ද ගොඩනැගේ. 1:2000 අනුපාතයක් ලෙස ඞඞ හෝ ඞශ ක්‍රෝමසෝම පිහිටියද ලිංගික අවයව මනාව නොපිහිටා හෝ අස්වාභාවිකව හෝ දරුවන් බිහිවිය හැකිය. පුරුෂ ශිෂ්ණය මනාව නිර්මාණය නොවීම, ශිෂ්ණය නිර්මාණය වුවද වෘෂණකෝෂ නිර්මාණය නොවීම, යෝනියක් පිහිටා යෝනි මාර්ගයක් නොපිහිටීම, යෝනි මාර්ගයක් ඇතුළෙන් පුරුෂ ශිෂ්ණය මුල් කොටස යැයි සැලකිය හැකි ආකාරයේ යම් ගැටිත්තක් දක්නට ලැබීම යනාදී ආකාරයට අන්තර් ලිංගික දරුවන් ඉපදිය හැකිය.

මිත්‍ර විසින් ට්‍රාන්සජෙන්ඩර් ලෙස සලකන සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයන් පිළිබඳ අදහසද ඔහු විසින් නිසි පරිශීලනයක් හෝ මූලාශ්‍ර පිළිබඳ ගවේෂණයකින් තොරව ලියා ඇති බව පෙනේ. සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් යනු ජීව විද්‍යාත්මකව ලිංගික අවයව එක් ආකාරයටත් මනෝ විද්‍යාත්මකව ප්‍රතිවිරුද්ධ ලිංගිකයන් මෙන් හැසිරීමට කැමති ආකාරයටත් නිර්මාණය වූවත් වේ. අප විසින් හැසිරිය යුත්තේ කුමන ආකාරයට ද, අපගේ කම්පන - ප්‍රකම්පන ක්‍රියා කළ යුත්තේ කුමන ආකාරයටද, චිත්තවේගීමය, හැඟීම්මය ආදී වශයෙන් අප විසින් ක්‍රියා කළ යුත්තේ ප්‍රතිචාර දැක්විය යුත්තේ කුමන ආකාරයටද යන්න අපට සංවේදනය කරනු ලබන්නේ මනස විසිනි. මනසේ ද හයිපොතැලමස යන මානසික සංවේදන ගබඩා කරන හා නිදහස් කරන ස්ථානයෙනි. ශ්‍රී ලංකාවේ මෙන්ම ලෝකයේ ඕනෑම රටක මෙවැනි ආකාරයට ශාරීරිකව එක් ලිංගයකටත් එහෙත් ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතාව වෙනත් ලිංගයකටත් අයත් පුද්ගලයන් සිටිති. EQUAL GROUND ආයතනයේ උපදේශන ඒකකයට කතා කළ එක් පුද්ගලයෙක් තමා සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයෙකු වන බවත් තමා සංක්‍රාන්ති වීම නිසා නිවසින් එළවා දැමූ බවත්, තමාගේ පෙනුම හා හැසිරීම නිසා රැකියාවක් ලබාගැනීමට අපහසු බවත් දන්වා සිටින ලදී. එහිදී ඔහුගේ සංක්‍රාන්තිභාවය පිළිබඳ මා විසින් අසනු ලැබූ කරුණුවලින් වැදගත් යැයි දැක්විය හැකි කරුණු කිහිපයක් උපුටා දැක්වීමට කැමැත්තෙමි. මෙම පුද්ගලයා නිමල් යනුවෙන් හඳුන්වමු.

"මගේ නම නිමල්.... මට මතකයි මම මොන්ටිසෝරි ගියපු පළවැනි දවස. නිල් පාට කමිසයක් මට අන්දලා තිබුණෙ. නිල්ම නිල් පාට වතුර බෝතලේකුත් මට තිබුණා. මගේ හොඳම යාළුවා වුණේ සඳමාලි. සඳමාලි ළඟ ලස්සන රෝස පාට සමනලයා හැඩේ තියෙන බෑග් එකක් තිබුණා. සඳමාලිගේ සපත්තු දෙකේ හිටියෙත් සමනල්ලු. පොල් ගහ වගේ කොණ්ඩෙකුත් එයාට තිබුණා. මටත් ඕන වුණා සඳමාලිගෙ වගේ බෑග් එකක්. එයාගෙ වගේ කොණ්ඩෙ වවන්න. එයාට වගේ වළලු දාන්න. ඒත් අපේ අම්මගෙන් ඉල්ලුවාම එයා මට බැන්නා. උඹ පිරිමි ළමයෙක් කියලා. මට සෙල්ලම් කරන්න ලැබුණෙ තුවක්කු, බෝල, බැට්. ඒත් මට ඕන වුණේ බෝනික්කෝ. මම ඒවා ඉල්ලුවත් මට ගෙදරින් ඒවා ලැබුණෙ නෑ. මම සෙල්ලම් කළේ ගෑනු ළමයි එක්ක. මට ඕන වුණේ සෙල්ලම් ගෙදර අම්ම වෙන්න. ඒත් හැමදාම මට තාත්තා වෙන්න කියලයි එයාල කියන්නෙ. එහා ගෙදර දෝණී තමයි හැමදාම අම්ම වෙන්නෙ. ඒ නිසා මට දෝණිව පේන්න බෑ.

නිමල් තම සංක්‍රාන්තික අදහස් දැක්වීමේදී අනුගමනය කළ ආනුභාවික ක්‍රමවේදයත් මිත්‍ර විසින් සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයන් තේරුම් කිරීමට අනුගමනය කළ පුරුෂෝත්තමවාදී ස්වයංගෝචර ක්‍රමයත් අතර අප දකින වෙනස නම් පුද්ගලයාගේ මානසිකත්වය හා ඔවුන්ගේ මනෝභාවයන් අතර ඇතිවිය හැකි ගැඹුරු සංකීර්ණතා තේරුම් ගැනීමේදී මිත්‍ර නම් මාධ්‍යවේදියාට වඩා මිත්‍ර නම් පුරුෂ මූලික මානවයා ඉදිරියෙන් සිටින බවයි. එහිදී අප විසින් තේරුම් කළ යුත්තේ ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතාව යනු උපන් ළදරුවා රෝස පාට ගවුමෙන් නිල් පාට ගවුමෙන් වෙන් කරන, බෝනික්කාගෙන් තුවක්කුවෙන් වෙන්කරන ක්‍රමයට වඩා වෙනස් එකක් බවයි. අප රට තුළ වෛද්‍යවරුන්, ආණ්ඩුකාරවරීයන් ලෙස සමාජ ප්‍රගමණයට දායකත්වය සපයන අයද සංක්‍රාන්ති සමාජභාවීය අයවළුන් අතර සිටින බවයි. බුදුන්වහන්සේ වරෙක පැහැදිලි කරන ආකාරයට වඩා වැදගත් වන්නේ පුද්ගලයා කරන්නේ මොනවාද? ඔවුන්ට එසේ වූයේ ඇයිද යන්න සෙවීම නොවේ. මනුෂ්‍යයෙකු ලෙසින් උපත ලබා අප විසින් අප වෙනුවෙන් හෝ සමාජය වෙනුවෙන් කරන්නේ මොනවාද යන්නයි. කිසියම් පුද්ගලයෙකු වැරදි ශරීරයක උපත ලැබීම නින්දාවට භාජනය කිරීමක් හෝ අපවාදයට ලක්කිරීමට හේතුවක් නොවන බවත් එම පුද්ගලයා සමාජයීය පුද්ගලයෙකු බවට පත්කිරීමට අප විසින් කළ යුත්තේ කළ හැක්කේ කුමක්ද යන්න සමාජයට පණිවිඩයක් ලෙස ලබාදීම මාධ්‍යවේදියෙකුගේ වගකීම විය යුතුය.

සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයන් හෝ සමසෙනෙහස් පුද්ගලයන් ලිංගික ශ්‍රමය සපයන අය හා ඔවුන් සමාජය නමැති ජීවියා ව්‍යාධියට පත්කරන බව පැවසීමට මිත්‍ර විසින් ගන්නා උත්සාහය මෙන්ම නාවිකයන්, වයෝවෘද්ධ සල්ලාලයන් කාමාතුරයන් කිරීමට ගන්නා උත්සාහයද ඔහු නියෝජනය කරන පුරුෂෝත්තමවාදී සංස්කෘතික රාමුව පිළිබඳ අදහස යළි යළි සනාථ කරයි. තායිලන්තයේ පතායා වෙරළ තීරයේ සුන්දර ලතාවන් සොයාගොස් අසරණ වූ පිරිමින්ගේ කතියන වේදනාව මිත්‍රගේ ලිපියෙන් සුසුම්ලනු දැකිය හැකිය. නාරි විශේෂඥවරුන්ට පවා හඳුනාගත නොහැකි තරමේ සිහින් පුරුලුකුල්. ඇති, ගමන ඇති, රූ ලීලාව ඇති සංක්‍රාන්ති සමාජභාවීය ගැහැනුන්ගේ ආකර්ෂණයට හසුවන, රැවටෙන, හෝටල් කාමරයේදී සත්‍ය තේරුම්ගන්නා පුරුෂයන් පිළිබඳ මිත්‍ර තුළ ඇති වේදනාව ඔහුගේ වේදනාව නොවේ. සප නොඇද බොළව දක්වා, සිතා නොමසෙන් දසත් දක්වා යනුවෙන් ගැහැනියට තර්ජනය කළ, හිර කළ ලිංගිකමය වශයෙන් උමතු වූ පුරුෂ මූලික මනෝභාවය පැහැදිලි කරයි. අවම තරමේ ඔහුගේ ලිපිය සුජාත කිරීමට යොදාගන්නා වෛද්‍ය අනිල් සමරනායක හෝ රොහාන්ත පෙරියප්පෙරුම මහතුන් විසින් දැක් වූ අදහස් සමග ලෝක සෞඛ්‍ය සංවිධානය 1990 වසරේ ඉදිරිපත් කළ අදහස් හා නිර්දේශ, අන්තර්ජාතික මනෝ විද්‍යා සංගමය 1973 දී කළ නිර්දේශ පරිශීලනය කළේ නම් මෙම ලිපිය වැදගත් ලිපියක් බවට පත් කරගැනීමට ඉඩ තිබුණි. ඉතින් මිත්‍ර අපි දැන්වත් මිත්‍ර වෙමු.

තුෂාර මනෝජ්